දහදිරි වංගුව

පත්තරේ තිබුණ කතාබහත් නැවතිලා. සංක්‍රමණිකයත් ඩිපෝට් කරලද කොහෙද. ඉබාගාතෙ ඇවිදිනකොට නිදහස් හිතට එන අදහස් සටහන් කරන්න කාලය ඇවිත් වගේ හිතුණ ගමන් කතා කළා. අවස්ථාව ලැබුණා. සන්නසට ස්තූතියි. ඔන්න දැන් මං ලියනවා. මගේ ලිවිල්ලත් දහ අට වංගුව වගේම තමයි. ඒත් කතාව කෙළින්.

මං මෙහෙම පටන් ගන්නම්.

වෙනස්ව හිතමු

මොකක්ද මේ? ඇයි මිනිස්සු මේකට මේ තරම් කැමතිද? ගීතයක් පොතක් ටෙලියක් බයිස්කෝප් එකක් ගත්තත් බලාපොරොත්තුවෙන්නෙ මේ ලේසි පහසු අති සරළ දේවල්. ඒක මුලු සමාජය පුරාම කිඳා බැහැලා වගේ. අලුත් දේකට ගැඹුරු අදඅ-සකට ප්‍රතිචාර දක්වන්න හරි උදාසීනයි. ඒකට වෙලාවක් උනන්දුවක් නැහැ. මහන්සිවෙන්න හිතෙන්නෙ නැහැ. ඔක්කොම පැනලා කරන්නෙ සුන්දර දේවල් විතරයි. එතකොට කරදරයක් නැහැ. වදයක් නැහ. විඳගෙන පාඩුවෙ උන්නැහැකි. එතකොට ලෝකෙ ඉදිරියට යයිද? ලෝකෙ ඉස්සරහට ගෙනියන එක කවුරු හරි කරයි. මෙච්චර කාලයක් උනෙත් එහෙමයි. ඒ වගේ වෙයි. එතකොට මේ "කවුරුහරි" කියන්නෙ කවුද? ඒ කට්ටිය තමයි අර රුදාකාරයො. ඇම්ම තියෙන කට්ටිය. අනුන් ගැන හිතන අය. වෙනස් කරන්න හදන අය. හැම දෙයක්ම වෙනස් විදියට දකින අය. ලෝකයේ වෙනස්ව හිතන අය. හැබැයි උන් ඉන්නෙ ටිකයි. කරන්න හදන්නෙ අමාරු වැඩ. මං කැමතියි උන් වගේ එකෙක් වෙන්න. අමාරු වැඩ කරන්න්න. හැමෝටම වඩා වෙනස් විදියට හිතන්න. සාධාරණ විදියට වැඩ කරන්න. සමහරවිට හුඟ දෙනෙකුට ඒක දිරවන එකක් නැහැ. ප්‍රශ්නයක් නැහැ. මං කැමතියි ඔට්ටු වෙන්න.

අපේ කම?

මගේ කමට අපේ කමට ගමේ කමට මේ දවස්වල මාර ඉල්ලුමක්නෙ තියෙන්නෙ. ඒක අර පහුගිය දවස්වල නැගල ගිය දේශප්‍රේමයෙම තවත් පැතිකඩක්. ගමේ කම ගැමි හඬ අපේ උරුමය ගැන කියනවෙන හැබැම පට්ට (පට්ට කියන්නෙ නව ශබ්ද කෝෂයේ "නියම" කියන එනට) ෂෝ එකක් කියල හඳුන්වල දීලා තිබුණ සහන් රන්වලගෙ ගම අවුලඤ්ඤං බලන්න ගියා. අම්මප පට්ට සෙනගක් තමයි හිටියෙ. ඇත්ත තමයි. ශිල්පීන්ගෙ කුසලතාවත් පට්ටම තමයි. සහන්ගෙ අපේ කම ගැන ලෙක්චර් එකත් හොඳයි. අවුල තියෙන්නෙ ප්‍රසංගයේ සමස්ථ ඉදිරිපත් කිරීම අපේ කමට ගලප්පන්නෙ කොහොමද කියන එකයි.

එකින් එක අරගෙන ඒක ගැන කතා කළොත් දවසක් කතා කරන්න වෙයි. බොහොම කෙටියෙන් එක දෙයක් දෙයක් මතක් කරන්නම්. වැඩේ පටන් ගත්තෙම මුලු ප්‍රේක්ෂකාගාරයම හිටවලා තුන් සරණය කියවලා. පළවෙනි අංගය ගම අවුලඤ්ඤං ගීතය. මොහොතකට ඉස්සෙල්ල සඳුන් කපුරු අරගෙන තුන් සරණේ ගිය කට්ටිය ගීතෙ තාලෙට ගමේ වයසක අම්ම කෙනෙක්ගෙ දුර්වලතාවක් අල්ලගෙන කරන අපහාස හා උසුලු විසුළු දිහා ඒ තුන් සරණේම ගිය ප්‍රේක්ෂකාගාරය මහ හඬීන් හිනාවෙවී බලන් ඉන්නවා. මමත් හිනා-වුණා. මං හිනා වුණේ අපේ කමට. අර දෙයියන් බුදුන් අදහන දෙමාපියන්ට වැඩිහිටියන්ට සළකන ජාතියකට ගිය කල දසාව ගැන හිතලා. වැඩේ මාරයි. ඊනෝදප්‍රනකයි. නැගල ගියා.

ඕනෙම දේක නිශේධනීය වගේම සාධනීය දේවලුත් තිවෙනවනෙ. සහන් අපට හොඳ කුසලතාපූර්ණ හොඳ ශිල්පීන් ටිකක් හඳුන්වලා දුන්නා. ඒ වගේම මෙල්බන් වලට ලේබකයෙක් ගීත රචකයෙක් පමණක් වෙලා හිටපු සිසිරව කොලිටි ආර්ස්ට් කෙනෙක් කියලා නියමෙට අඳුන්නලා දුන්නෙ එදා කියලයි මට හිතෙන්ඉ. මට නම් වැදගත් වුණේ එච්චර තමයි. වෙනස තිබුණේ සහන්ල අපේ කම ගමේ කම ව්‍යත්තිය මට්ටමින් විකුණන එක විතරයි. අවසන් වශයෙන් දහදෙනෙක් ගෙන්නලා ෂෝ එකක් කිරීමේ අවදානම ගත්ත එක ගැන ලක්මැදුරට ස්තූතියක් පුදකරන්න කැමතියි.

රේල් පීලි

පහුගිය දවසක දේශපාලන රැස්වීමක් බලන්න ගියා මොනෑෂ් එකට. දේශකයා ජවිපෙ විජිත හේරත්. මෙල්බන් වල විප්ලවීය දේශපාලනය කරපු සතෙ-ර්දරවරුත් දැන් එක අරමුණකට පාරවල් දෙකකනෙ යන්නෙ. ඒක හොඳයි. ලංකාවෙ වගේමයි. ලංකාවෙ කට්ටිය පාරවල් දහයක විතර එකම අරමුණකට යනවා. දැන් කාලයක් තිස්සේ. දශක ගණනාවක් තිස්සෙ ඒ ගොල්ල යන්න රේල් පාරවල් වල. ඒ නිසා ට්‍රැක් මාරවෙනවා මීසක් කවදාවත් එකතු වෙන්නෙ නැහැ. මෙහේ නම් එහෙම වෙන එකක් නැහැ කියලා හිතෙනවා.

රැස්වීමට ගියාම ඇතිවුණේ අවංකවම කණගාටුවක්. විජිත වගේ කෙනෙක් එනකොට ඉන්න ඕන ප්‍රමාණයක්ද ඒ හිටියෙ. විජිතලගෙ දේශපාලනයත් එකක් මං එකඟ නොවුණත් මෑතක සිට ජවිපෙ ගමන් මග වෙන්සවෙමින් යන වඩ පෙනුණ නිසයි මම ගියේ. ඒක ඇත්ත බව මට පැහැදිලි වුනා. විජිතගෙ දේශන තුළ කොයි වෙලාවකවත් විප්ලවය නිර්ධන පන්තිය සමාජවාදය කියන වචන පාවිච්චි වුණේම නැහැ. කතා කළේ රටේ ප්‍රශ්න සමාජ සාධාරණත්වය සමානාත්මතාව හා ප්‍රජාතන්ත්‍රවාදය ගැන. ඒක ලොකු වෙනසක්. හැමදාම අලුත් දෙයක් කරන්න වෙනස් විදියකට හිතන වැඩ කරන විජිතලා වගේ මිනිස්සු කියන්නෙ මොනවද කියලා අහන්න යන්න මෙල්බන් වල ඉන්න මිනිස්සුන්ට යුතුකමක් සහ වගකීමක් තියෙනවා කියලයි මට හිතෙන්නෙ.

මිනිස්සුන්ට වැදගත් සමාජ සාධාරණත්වය නෙ-වෙයිනෙ. නිවන් යන එකනෙ. ඕස්ට්‍රේලියාවට ආවට පස්සෙ ඊළඟට යන්න ඉතුරුවෙලා තියෙන්නෙ එතැනට විතරයි කියලනෙ හුඟක් අය හිතන්නෙ.

සනා බෝයි

අපේ සනා රුහුණු කැම්පස් එකේ කොල්ලොත් එක්ක ගේමට සෙට් වෙලා කියලා අන්තර්ජාලයෙන් පින්තූරත් එක්ක දැකගත්තට පස්ස ඇති වුණේ මාර හැඟීමක්. ශාන්ත සර්වේස් එකේදී සනා මැටින් එකේ (අපේ කාලෙ පිච් එකට උඩින් දාන කොහු ලණු පැදුරක් වගේ එකට කිව්වෙ මැටින් එක කියලයි. කට්ටිය සෙල්ලම් කරන්න එනකොට කර ගහගෙන ඇවිත් ඉවර වෙලා යනකොට ආපහු අකුළගෙන යනවා) ක්‍රිකට් ගහනවා අපට තාමත් මතකයි. එතකොට දැන් වගේ පහසුකම් තිබුණෙ නැහැ. කොටින්ම කකුලට දාන පා ආවරණ (පෑඩ්) ලණු වලින් ගැට ගහගෙන ප්‍රැක්ටිස් කරපු කාලයක් තිබුණා. ඒ ලණු කොයි වෙලාවෙ කැඩෙයිද කියලා බයෙන් සැකෙන් පරීක්ෂාවෙන් ඉන්න පුරුද්දක් තිබුණා. ඒ පුරුද්දට වෙන්න ඇති සනා ඉන-්ටනැෂනල් ගේමකට ආවත් ගහන්න ඉස්සෙල්ල පුරුද්දට වගේ පෑඩ් එක හොල්ලලා බලන්නෙ. ඒහෙම හිටපු අපේ සනා බෝල පලපු කාලෙ අපේ වගේම රටේ වීරයෙක්. ඒකනෙ දේශපාලනය ගැන අබ ඇටයක තරම්වත් දැනුමක් නොතිබුණත් කවුසලේට පත්කරලා එව්වෙ.

ලංකාවෙ දේශපාලනයට ඔය විදිහට එන හැම දෙනාටම වෙන දේ සනාට වෙනවයි කියන එක අපිට අරුමයක් නොවුණෙ මොකද සනාගෙ ඇඟේ හයියට වැඩිය මොලේ තරම ගැන දකුණෙ අපි දන්න නිසා. ඒත් ඉතීන් එක එකාගෙ අවශ්‍යතා පිරිමහන්න තමන්ට හුරේ දාපු කොල්ලන්ට පොලු පාරවල් දෙන්න චන්ඩිත් දක්කාගෙන ගිය එකට නම් කවදාවත් සමාවක් දෙන්න බැහැ. මේක නම් එච්චර හොඳ ලෙඩක් නෙවෙයි සනා. උඹේ ක්‍රිකට් ගැහිල්ලට තාමත් පොඩි ලෙන්ගතු කමක් තාමත් හිතේ තියෙන නිසයි කියන්නෙ. උඹට වැඩි හොඳ කෙළි කාරයෙක් වෙච්ච එස් බී ත් කොල්ලො ඉස-්සරහ අඩියක් පස්සට යනකොට උඹ අඩි දෙකක් ඉස්සරහට පැනලා වැඩ දෙන්න ගිහිල්ලා පස්ස බිම ඇන ගන්නවා දකින්න අපි කැමති නැහැ. පොලිටිකල් ගේම ක්‍රිකට් ගේම තරම් පිරිසිදු නැහැ සනා. උඹ ගහපු ඔක්කොම ගේම් රටම දන්නවා. ඒ වුනාට සනා පොලිටිකල් ගේම නම් ඒ ඔක්කොම ගේම් වලට වඩා වෙනස්ය කියන එක හිතේ කියාගත්තොත් හොඳයි.

පිස්සු කෙළින්න එපා බං

පහුන දාක කසුන් කල්හාරගෙ ෂෝ එක බලන්න ගියා. ඒකනම් කවදාකවත් අමතක වෙන්නැති අත්දැකීමක්.. සින්දු නිසා නෙවෙයි.. මගෙ ජීවිතේ පලමුවෙනි පාරට ඉංගිරිසියෙන් සිංහල ෂෝ එකක් බැලුවමයි.

ගායකයා ඉංගිරිසි කතා නොකරන කලාකාරයෙක්. කියන්නෙ සිංහල සින්දු. ශාලාවෙ සියයට සීයක්ම හිටියෙ සිංහල මිනිස්සු ගෑනු. එහෙව් එකේ මුලු ෂෝ එකම ඉංගිරිසියෙන් එනවුන්ස් කරමින් කළ විකාරය නම් තාමත් දරාගන්න බෑ වගේ. ප්‍රේක්ශකාගාරය පුරා ඇවිද ඇවිද කසුන්ගෙ සින්දු ගැන ප්‍රේක්ෂකයන්ගෙන් ඉංගිරිසියෙන් අහද්දි නිවා-ඩුවකට ඕස්ට්‍රේලියාවට ආපු අර අහිංසක තාත්තලා ඇඹරුණ හැටිවත් මේ නිවේදක කොලු ගැටයට තේරුණේ නැහැ වගේ. එයිටත් වඩා ඉංගිරිසියෙන් සියලු නිවේදන කරමින් කසුන්ගෙන් සිංහලෙන් ප්‍රශ්න අහපු හැටි දැක්කම හිතුණේ "ඒයි කසුන්.. අපි මෙහෙ ඉංගිරිසි කතා කරන පොරවල්.. උඹට ඉංගිරිසි බැරි නිසා ඔන්න මං උඹෙන් සිහලෙන් අහනවා" වගේ අදහසක්.

මේ අපබ්‍රංස නිවේදක මල්ලිට හොඳම උත්තරේ ලැබුණෙ ප්‍රේක්ෂකාගාරයේ හිටපු සුපර් ස්ටාර් තරගයේ මලිත් ගෙන්. කසුන් ගැන ගෙන් ඉංගිරි-සියෙන් ඇතුවහම හැමෝටම පේන්න නැගිටලා මලිත් මල්ලි සුද්ද සිංහලෙන්ම අර නිවේදක මල්ලිට දුන්නෙ නියමම නියම උත්තරයක් තමයි.

"පිස්සු කෙළින්නෙ නැතිව හිටපං බං"

වින්දනයක් නැති පරම්පරාවක්

දැන් කාලෙ කෙල්ලෙක් කොල්ලෙකුට බූට් එකක් තිබ්බ ගමන් කොල්ලා කරන්නෙ තමං අර තරං ආදරේ කළ කෙල්ලට අමානුෂික විදිහට පිහියෙන් ඇනලා මරලා දාන එක. මේ ගැන අපේ රත්න ශ්‍රී විජේසිංහ කවියා හොඳ කතාවක් කියලා තිබ්බා පහුන දවසක. කතාව මෙහෙමයි.

මෙහෙම දේවල් වෙන්නෙ මිනිස් හදවත් කලාවෙන් සෞන්දර්යයයෙන් ඈත් වෙච්ච නිසයි..

අම්මපා ඇත්ත කතාව.. අපේ කාලෙ කෙල්ලෙක් කොල්ලෙකුට බූට් එකක් තිබ්බබ කළේ කෙල්ලට දුක හිතෙන ලියුමක් ලියල යවන එක. "අවසර නැත මට ඔබෙ අත ගන්නට" "අවසන් ලියුමයි ඔබට ලියන්නේ" "මට මෙන් ඔහුටද කඳුල ඔබයි" ඔය වගේ සින්දු කෑලි ටිකකුත් දාලා ඇඹෙන්න ලියලා යවනවා. සමහර විට ඒකෙන්ම කෙල්ල ආයෙම කැමති වෙච්ච වෙලාවලුත් තියෙනවා. පොඩ්ඩක්වත් ලියාගන්න බැරි එකෙක් නම් අර ගොලු හදවතේ සුගත් වගේ බෝතලේකට සෙට් වෙලා හරි දුක නිවා ගන්නවා. දුක විඳීමත් එක්තරා වින්දනයක් කරගන්නවා. දැන් වෙලා තියෙන්නෙ මේ දුක විඳ ගැනීමේ හැකියාව නැති වෙලා ගිහින් තියෙන එකයි. ඒකට හේතුව මිනිස්සුන්ගෙ හදවත් තුළින් රසාස්වාදය කියන එක තුරන් වීමම තමයි. ඇයි දැන් තියෙන්නෙ කපන්න කොටන්න මරන්න කියන සින්දුනෙ.

හැමෝටම ආදරයෙන්
චූටි මල්ලි

රටවල් 40ක ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර www.thisara.com